# සාමය පිළිබඳ දර්ශනය සඳහා පාදක වූ ආගමික සංකල්ප පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

# [A Critical Study on Religious Concepts that based for Philosophy of Peace]

**Samantha Ilangakoon**[1]

**Abstract**

It is an objective fact that there are concepts in religious traditions which motivate for peaceful drives. Those who oppose this view, argue that religion from a long time had provided stimulus for conflicts and wars. There are religious followers who claim that they involve in war in the name of religion. However, this discussion inquiries into the religious ideas which had been utilized as peace sources in the recent times. This article is being written with the focus of the contribution of religious beliefs, observances and institutions to peace in different ways. It is mainly a critical investigation into peaceful concepts in world religions. Here commonly identifiable religious moral ideas are investigated such as non-violence, tolerance, forgiveness, concern in otherness, altruism, giving, mutual duties and how they had contributed to modern peace thought. Mostly religious traditions promote reconciliation and non-violence and provide ethical frames for social integrity. Religion works even for the social justice and equality. This paper intends to show how religion with its narrations and symbols can motivate for peaceful co-existence using historical and contemporary examples. Another purpose would be to show the potentiality of religion for peace through peace thinkers and activists. This article shows that the importance an approach that bases on religion for peace and religious teachings provide sources to enrich a peaceful culture that suits to global contexts and complementary to modern secular methods.

**Key words:** Ethics, Peace, Reconciliation, Religion

1. Senior Lecturer, Department of Philosophy, University of Peradeniya.
E-mail: samantha@arts.pdn.ac.lk https://orcid.org/0009-0001-0493-6872

Received: 03 March 2024, Accepted revised version: 20 June 2024.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

**සාරසංක්ෂේපය**

ආගමික සම්ප්‍රදායන්හි හමුවන ඉගැන්වීම්වල සාමය සඳහා ප්‍රේරණ සපයන බොහෝ සංකල්ප අන්තර්ගත බව පොදුවේ පිළිගන්නා කරුණකි. ඒ අතර ම එයට විරුද්ධ ව කරුණු හා සාක්‍ෂ්‍ය ඉදිරිපත් කරන්නෝ ආගම බොහෝ කලක සිට ගැටුම් සහ යුද්ධය ඇති කිරීමෙහි ලා උත්තේජන සපයා ඇති බව පවසති. තම ආගමේ නාමයෙන් යුද්ධ ක්‍රියාවන්ට සහභාගී වන බව පවසන ආගමික බැතිමතුන් නැත්තේ ද නො වේ. කෙසේ වුවත් මෙම සාකච්ඡාවෙන් විමසා බලන්නේ ආගමික අදහස් කුමනාකාරයෙන් සාමය ඇති කිරීමේ ප්‍රභවයන් ලෙස මෑත කාලයේ ව ක්‍රියාත්මක ව තිබේ ද? යන්න යි. ආගමික විශ්වාස, වත් පිළිවෙත් සහ ආයතන සාමය සඳහා දායක වන විවිධ ආකාරයන් කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ලිපිය රචනා කරනු ලැබේ. එය ප්‍රධාන වශයෙන් ලෝක ආගම්වල එන සාමයික සංකල්ප පදනම් කරගෙන සිදු කරනු ලබන විචාරාත්මක විමර්ශනයකි. පොදුවේ ආගම්වල එන අවිහිංසාවාදී අදහස්, ඉවසීම, සමාව දීම, අනිකා පිළිබඳ දක්වන අනුකූලතාව, පරහිතකාමී බව, පරිත්‍යාගශීලීත්වය, අන්‍යෝන්‍ය යුතුකම් වැනි ආගමික ආචාර ධර්ම කෙසේ නූතන සාම සංකල්පයන්හී ප්‍රභවය කෙරෙහි බලපා තිබේ ද? යන්න මෙහි දී විචාරාත්මක ව විමසා බලනු ලැබේ. ආගමික සම්ප්‍රදායන් බොහෝ විට සංහිඳියාව සහ අවිහිංසාව ප්‍රවර්ධනය කරන අතර ම සමාජ ඒකාබද්ධතාවට අවශ්‍ය කරන සදාචාරාත්මක රාමු සපයයි. එමෙන් ම සමාජ සාධාරණත්වය හා යුක්තිය වෙනුවෙන් පෙනී සිටීම දක්වා ම ආගම ක්‍රියාත්මක වෙයි. ඓතිහාසික හා සමකාලීන උදාහරණ විශ්ලේෂණය කිරීමෙන්, ආගමික ආඛ්‍යාන සහ සංකේත මඟින් පුද්ගලයන් සහ ප්‍රජාවන් සාමකාමී සහජීවනයකට පෙලඹවිය හැකි ආකාරය මෙම පත්‍රිකාව මඟින් පෙන්නුම් කෙරේ. සාමය සඳහා ආගමේ ඇති විභවතාව සාම චින්තකයන් හා ක්‍රියාධරයන් ඇසුරෙන් පෙන්වා දීම ද මෙහි තවත් අරමුණකි. මෙම ලිපිය පෙන්වා දෙන්නේ සාමය සඳහා ආගම පදනම් කරගත් ප්‍රවේශ ඉතා වැදගත් වන අතර නූතන ලෞකික ක්‍රමවලට අනුපූරක වන හා ගෝලීය සන්දර්භයන්ට ගැළපෙන සාම සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා මූලාශ්‍රය ආගමික ඉගැන්වීම්වලින් ලැබෙන බව යි.



**ප්‍රමුඛ පදඃ** ආචාරධර්ම, ආගම, සාමය, සංහිඳියාව


**හැඳින්වීම**

සාමය පිළිබඳ දර්ශනය සැලකෙන්නේ සාමය සඳහා කැප වී සිටින විවිධ ක්ෂේත්‍රවල පුද්ගලයන්ගේ සංකල්පීය හා චින්තන පසුබිම ගොඩනගමින් ඒ සඳහා තර්කානුකූල හා ශක්තිමත් බුද්ධිමය පදනමක් සපයන උපවිෂයක් ලෙස යි. මෙම සංකල්ප බිහි ව ඇත්තේ ඓතිහාසික මෙන් ම භෞගෝලීය හා සංස්කෘතික පදනම් ආශ්‍රය කරගෙන යි. මෙම රචනාව දිග හැරෙන්නේ ප්‍රමුඛ වශයෙන් සාමවාදී චින්තනය කෙරෙහි ආගමික මූලාශ්‍රයවල අන්තර්ගත කරුණු කෙසේ පාදක වී තිබේ ද? යන කරුණ විචාරාත්මක ව විමසා බැලීම සඳහා යි.

**සාහිත්‍ය විමර්ශනය**

ආගම හා සාමය සම්බන්ධයෙන් ලියැවී ඇති වෙන ම සාහිත්‍යයක් දක්නට ලැබේ. එහෙත් එම සාහිත්‍යයේ දක්නට ඇති ප්‍රධාන දුර්වලතාවක් වන්නේ එක් එක් ආගම වෙන වෙන ම ගෙන ඒවායේ අන්තර්ගත සාමයික අදහස් මතුකොට දක්වා තිබීම යි. හැම ආගමක් ම සාමයික ආගම් ලෙස මතු කොට දක්වා තිබීම වැදගත් ය. එහෙත් සමකාලීන වශයෙන් අවශ්‍ය වන්නේ සාකල්‍යාත්මක අර්ථයකින් අඩු ම වශයෙන් ලෝකයේ වැඩි ජනගහනයක් අදහන ලෝක ආගම්වල අන්තර්ගත සාමයික අදහස් අඩු වැඩි වශයෙන් නූතන සාමවාදී

චින්තනය බිහි කිරීමට බලපා තිබෙන බව මතුකොට දැක්වීම යි. මෙම පර්යේෂයේ දී මතු වූ පර්යේෂණ හිඩැසක් ලෙස ආගමික සංකල්පනාවන්හී අන්තර්ගත සාම සංකල්ප පිළිබඳ පොදු හා වාස්තවික ප්‍රවේශයක් නොමැති වීම දැක්විය හැකි ය.

නූතන සාමවාදී චින්තනයෙහි න්‍යායාත්මක පදනම සැපයූ යොහාන් ගල්ටුන් ලියන ලද "සාමය හා බුදුදහම" නැමති කෘතියෙහි ආගමක් ලෙස බෞද්ධාගමේ සාමය සඳහා රුකුල් දෙන කරුණු විස්සක් ඇති බව පෙන්වා දෙයි. එමෙන් ම සාමයට අදාළ නො වන කරුණු අටක් ගැන ද ඔහු මතුකොට දක්වයි. "බුදු දහම හා සාමය" මැයෙන් ප්‍රකාශිත ග්‍රන්ථය කේ.එන්. ජයතිලක හේග් නුවර පවත්වන ලද දේශනයක මුද්‍රිත ග්‍රන්ථය යි. මෙහි දී බුදු දහමේ ඓතිහාසික පදනම පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කරමින් ඔහු බෞද්ධ ඉගැන්වීම්වල ඇති සාමයික සිද්ධාන්ත පිළිබඳ පුළුල් විග්‍රහයක් සපයයි. මෙම දේශනය වෙනත් ආගමික විද්වතුන් ඒ ඒ ආගම්වල අන්තර්ගත සාමයික චින්තන ගැන සොයා බැලීමට පෙලඹවූවකි. කේ.එන්. ජයතිලක විසින් ම ලියා ඇති "අනිකුත් ආගම් කෙරෙහි බෞද්ධ ආකල්පය" නැමති කෘතිය තත්කාලීන බහුත්වවාදී ආගමික හා ජාතිකත්වයට අනුව බුදුන් වහන්සේ කටයුතු කළ ආකාරය විස්තර කරයි.

වයි. කරුණාදාස විසින් ප්‍රකාශිත "මුල් බෞද්ධ ඉගැන්වීම්" නැමති කෘතියෙහි නූතන ලෝක තත්වය හා දැනුම් පද්ධතිය ද උපයෝගී කරගෙන සාම චින්තනයෙහි සංවර්ධනයට යොදාගත හැකි බෞද්ධ අදහස් නූතන සාමවාදී අදහස් සමඟ ගැළපෙන ආකාරය පෙන්වා දී ඇත. අසංග තිලකරත්නගේ ලිපි මාලාවක එකතුවක් වන "අන්තර් ආගමික අවබෝධය" නැමති ශාස්ත්‍රීය ග්‍රන්ථයවල බෞද්ධාගම ප්‍රමුඛ ව වෙනත් ආගම්වල නිලීන ව ඇති සාමයික සංකල්ප ඉස්මතු කොට දක්වා ඇත. චන්ද්‍රිම විජේබණ්ඩාර සහ එච්.එම්. මොරටුවගම විසින් රචිත ආදි බෞද්ධ චින්තනය නැමති කෘතියෙහි බෞද්ධ දර්ශනයෙහි ඇති සාමග්‍රීකරණය ගැන ප්‍රමාණාත්මක රචනාවක් අන්තර්ගත වන්නේ ය.

මාකුස් ක්‍රෙමර් විසින් රචිත "සාමය-අදහසක් පිළිබඳ ඉතිහාසය" නැමති කෘතිය බටහිර ආගම්වල එන සාමයික සංකල්ප තේරුම් ගැනීම උදෙසා බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නේ ය. බෙට් චෙප්කොරිර් විසින් රචිත "සාමය හා සහජීවනය උදෙසා ආගමික ප්‍රවේශයක්" නම් කෘතිය සංක්ෂිප්ත වශයෙන් ආගම්වල අන්තර්ගත සාමවාදී අදහස් ඉදිරිපත් කරයි. මෙහොමඩ් රෆීක් විසින් රචිත "ලොව ප්‍රධාන ආගම්වල පැණෙන සාම සංකල්පය" නම් වූ පර්යේෂණ ලිපියේ ද ලෝකයේ ප්‍රධාන ආගමික සම්ප්‍රදායයවල හමුවන සාමයික සංකල්ප පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් වන්නේ ය.

ජයන්ත සෙනෙවිරත්නගේ ලිපියක් වන "විසිවන සියවසේ අවිහිංසාවාදී සමාජ විප්ලවය හා සාමය" නම් වූ ලිපිය නූතන සාමයික සංකල්පයක් වන අවිහිංසාවාදී චින්තනය පැරණි භාරතීය ආගම් පසුබිම් කොට ඇති වූවක් බව පෙන්වා දෙයි. විජිත රාජපක්ෂ විසින් රචිත "අවිහිංසාවාදී දේශනාව පිළිබඳ සලකා බැලීම් කිහිපයක්" නම් වූ ලිපිය පෙන්වා දෙන්නේ හිංසනයෙන් බැහැර වීමේ චින්තනය වූ කලී ලොව පවත්නා බොහෝ ආගම්වල නිලීන ව ඇති ආචාරාත්මක යෙදවුමක් බව යි. රොබට් ඒ. බූවීගේ "ආචාරධර්ම අධ්‍යයන" නැමති කෘතියේ පෙන්වා දී ඇත්තේ බටහිර ලෝකයේ සාමවාදී ව්‍යාපාර බිහි වීමටත් ඒවායේ චින්තන පදනම සකස් කිරීමටත් දේවධර්මවාදයෙන් මහත් පිටුබලයක් ලැබී ඇති බව යි.

### පර්යේෂණ ගැටලුව

සාමවාදී අදහස් බිහි වන්නේ සාමය නිශේධනය වන ප්‍රවණතා සමකාලීන ව වශයෙන් ක්‍රමක්‍රමයෙන් ගෝලීය වශයෙන්

මතු වන්නට පටන් ගැනීමත් සමඟ ම ය. ඒවා බොහෝ දුරට සාර්ථක වී තිබෙන්නේයැයි පිළිගත හැක්කේ තෙවැනි ලෝක යුද්ධයක් ඇති වීම වළක්වා ඇති පසුබිමක ය. කෙසේ වුව ද මෙම සාමවාදී අදහස් ආකස්මික ව ඇති වූ බවට පිළිගත නොහැකි ය. නීතිය, සදාචාරය, සංස්කෘතිය හා ශිෂ්ටාචාරය වැනි සමාජීය ප්‍රපංච පෝෂණය කිරීමෙහි ලා ආගමික සංකල්ප මූල බීජ සපයා ඇති ආකාරයෙන් ම සාම චින්තනය ගොඩ නැඟීමෙහි ලා ආගම දක්වා ඇති කාර්යභාරය විමසා බැලීම මෙහි දී සිදු කෙරේ. සාමය ගොඩනැඟීම හා සාම සංස්කෘතියක් ඇති කිරීම ලෞකිකකරණයේ දී සැලකෙන්නේ හුදෙක් ආගමෙන් විනිර්මුක්ත ව සිදු කළ හැකි කාර්යක් ලෙස යි. ආගම අනුව මිනිසුන්ගේ යම් ආකාරයක බෙදීමක් දක්නට ලැබෙන නිසා සාමය කෙරෙහි ආගමික න්‍යායන් භාවිත කිරීම සුදුසු නොවන බව අතැමෙකුගේ අදහස යි. එසේ වුවත් සාම අධ්‍යාපනයේ දී භාවිත කරන බොහෝ උපකරණ හා න්‍යාය ආගමික වශයෙන් දක්නට ලැබේ. එබැවින් මෙහි දී පර්යේෂණ ගැටලුව ලෙස නූතන ලෝකයේ ජනප්‍රිය සාමවාදී චින්තනය කෙරෙහි ආගමික සංකල්ප මූලාශ්‍රය වී තිබේ ද? යන්න යි.

## පර්යේෂණ අරමුණු

දෙවැනි ලෝක යුද්ධයෙන් පසු ව නැවත එවැනි බිහිසුණු යුද්ධයක් ඇති වීම වැළැක්වීමටත් ලොව පුරා සාමයික අදහස් ව්‍යාප්ත වීමටත් ලෞකික විෂයක් ලෙස සාම අධ්‍යාපනයෙහි ඇති වූ න්‍යායාත්මක මෙන් ම ප්‍රායෝගික සංවර්ධනය බලපා තිබේ. එහෙත් සාමවාදය සඳහාත් ලෞකික විෂයක් ලෙස දියුණු වූ සාම අධ්‍යයනය සඳහාත් ලෝකෝත්තර හා ආධ්‍යාත්මික දැනුමක් වන ආගම ආභාසය ලබා ඇති බවට කෙරෙන සාකච්ඡා අවම ය. ආගම සැලකෙන්නේ මූල විද්‍යාවක් (Proto-science) ලෙසට යි. එනම්, නූතන විද්‍යාවන්ගේ උපතට බලපෑ මූල සංකල්ප අන්තර්ගත වූයේ මූලික වශයෙන් ආගමික පද්ධතියෙහි ඒවායෙහි ඇති විද්‍යාත්මක බව ආනුභූතික විද්‍යා දැනුමට ප්‍රශ්න කළ හැකි වුවත් පැරණි මානවයාගේ විද්‍යාව වූයේ ආගම යි. ඒ නිසා නූතන සාමවාදයටත් එහි න්‍යායාත්මක හා ප්‍රායෝගික අංශ සංවර්ධනය කිරීමෙහි ලාත් ආගම දක්වා ඇති දායකත්වය අගය කරමින් එය තව දුරටත් පවත්වාගෙන යාමේ වැදගත්කම පෙන්වා දීම මෙහි එක් අරමුණකි. එහි දී ප්‍රමුඛ වශයෙන් ආගමික සංකල්ප, සාමයික දර්ශනය ගොඩනැඟීම උදෙසා මූලාශ්‍රයවලින් දක්වා ඇති දායකත්වය සකාරණව ව ඔප්පු කොට දැක්වීමට උත්සාහයක් ගනු ලැබේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙහි දී භාවිත කරන විධික්‍රමය දාර්ශනික ක්‍රමය යි. විෂයක් වශයෙන් දර්ශනය සැලකෙන්නේ ද්විතියික ගණයේ දැනුම පද්ධතියක් ලෙස යි. ඒ නිසා දාර්ශනික දෘෂ්ටි කෝණයෙන් පළමු ගණයේ විෂයන් දෙස බැලීමට හා අර්ථකථන ඉදිරිපත් කිරීමට දාර්ශනිකයාට ඓතිහාසිකව ම නිදහසක් හිමි ව තිබේ. සාමය නමැති සංකල්පය හා ආගම නැමති ප්‍රපංචය අයිති වන්නේ පළමු ගණයේ විෂය පද්ධතීන්ට ය. තව ද දර්ශනය වැනි විෂයකට තවත් ක්ෂේත්‍රයකට ශක්තිමත් පදනමක් සපයන්නට හැකි ය. මෙහි එක් වැදගත් ක්‍රමයක් වන්නේ සොක්‍රටීක යුගයේ සිට ම පවතින ප්‍රශ්න නැඟීම යි. දාර්ශනිකයන්ට යුද්ධයේ සහ ප්‍රචණ්ඩකමේ ඇති ආචාරාත්මක බව ප්‍රශ්න කිරීමට සම්පූර්ණ නිදහසක් තිබේ. නූතන සමාජ හා මානවීය විද්‍යා ක්ෂේත්‍රවල අධ්‍යයනයට බලපා තිබෙන විචාරාත්මක න්‍යාය ද මෙහි ලා භාවිත කෙරෙන ක්‍රමවේදයෙහි න්‍යායාත්මක පදනම සපයනු ලබයි. මෙහි දී දත්ත එකතු කිරීමේ ක්‍රමය අදාළ සාහිත්‍යය මත තීරණය වන්නේ ය. අදාළ ප්‍රාථමික සහ ද්විතීය මූලාශ්‍රය මත පදනම් ව තොරතුරු ගවේෂණය කරන ලදි. සාහිත්‍ය සමීක්ෂණයේ දී සාම සංකල්පයට අදාළ වූ ආගමික අදහස් එකතු කරන ලදි.

**පර්යේෂණයේ වැදගත්කම**

මෙවැනි පර්යේෂණයක් වැදගත් වන්නේ එක් පැත්තකින් ආගම පාරභෞතික හෝ පාරලෞකික පද්ධතියක් සේ නොසලකා හැරෙන ප්‍රවණතා මතුවන කාලයක ය. අනික් අතින් ගෝලීය වශයෙන් ආගම දේශපාලනික හා ත්‍රස්තවාදි පරමාර්ථ සඳහා යොදා ගැනෙන කාලයක ආගමෙහි පැවැත්මට එල්ල වී ඇති තර්ජන හමුවේ ආගමෙහි ප්‍රායෝගිකත්වය හා උපයෝගීතාව බුද්ධිමය වශයෙන් පවා ප්‍රශ්න කැරෙන යුගයක ය. නිරාගමික ප්‍රවණතා පවා මතු වන්නේ මෙසේ ආගම විවිධ අරමුණු සඳහා උපකරණාර්ථයෙන් අවභාවිත කිරීම නිසා ය. එහෙත් ආගමික සංකල්පනා තවමත් මානව ජීවිතය සමඟ බද්ධ ව පවතින බවත් ඒවා තව දුරටත් මානව චින්තනය දියුණු කිරීමට දායක වන බවත් පෙන්වා දීම සමකාලීන වශයෙන් වැදගත් ය. තව ද ආගම වෙනත් පරමාර්ථ උදෙසා යොදා ගැනීම වැළැක්වීමට ඇති කාලීන අවශ්‍යතාව ද මෙ මඟින් ගම්‍ය කෙරෙන අදහසකි.

**සාකච්ඡාව**

**සාමය පිළිබඳ දර්ශනය**

සාමය පිළිබඳ කථා කිරීම, අගය කිරීම, වර්ණනා කිරීම, න්‍යාය ගොඩනැඟීම හා සාමය උදෙසා ප්‍රායෝගික ක්‍රියා මාර්ග ඉදිරිපත් කිරීම සාමය පිළිබඳ දර්ශනය යි. මේ අනුව සාමවාදියා ඍජු ව ම යුද්ධය හා ප්‍රචණ්ඩත්වය හෙළා දකියි. විරුද්ධ වෙයි. පිටු දැකීම අපේක්‍ෂා කරයි. බැහැර කරයි. අනිටු විපාක පෙන්වා දෙයි. ගැටුම නැති කිරීමට අදාළ ප්‍රායෝගික ක්‍රියා මාර්ග නිර්දේශ කරයි. මේ අනුව සාමවාදයෙහි චාරිත්‍රමය අංශයක් මෙන් ම වාරිත්‍රමය අංශයක් ද දක්නට ලැබේ. එමෙන් ම අසුබවාදී ව යුද්ධය දෙස බැලීමත් සුබවාදී ව සාමය දෙස බැලීමත් සාමවාදියෙකුගේ ලක්‍ෂණයකි. සාමවාදියා සැමවිට ම කටයුතු කරන්නේ සාමවාදී ආචාර ධර්ම පද්ධතියක් අනුගමනය කරමින් ය. එහි කේන්ද්‍රීය ලක්‍ෂණයක් වන්නේ අවිහිංසාව යි. ඒ නිසා සාමවාදියා අවිහිංසාවාදී න්‍යාය අනුගමනය කරයි. එය ආචාරාත්මක සංකල්පයකි. අනිකාට හිංසා කිරීම හෝ මරණයට පත් කිරීම වැරදි බව ප්‍රකාශ කරන සාමවාදියා තම න්‍යාය එම ප්‍රතිග්‍රහිතය ඔස්සේ ඉදිරියට ගෙන යන්නේ සාමය පිළිබඳ තර්කණදාමයක් ගොඩනංවමිනි (Bowie, 2001).

1. මරණයට/ හිංසාවට භාජනයට කිරීම වැරදි ය.
2. යුද්ධයේදී හිංසා කිරීම් හා මරණයට පත් කිරීම් සිදු වේ.
3. එසේ නම් යුද්ධ කිරීම වැරදි ය.

යුද්ධය වැරදි ක්‍රියාවක් බවට සාමාන්‍යයෙන් පිළිගත්තත් රාජ්‍යය පිළිබඳ සංකල්පයේ දී එය තම රටෙහි ස්වෛරීභාවය සඳහා අනුගමනය කළාට කම් නැත යනුවෙන් පිළිගැනීමක් ඇත. එබැවින් රාජ්‍යයේ හමුදාවට රටේ ආරක්‍ෂාව සම්බන්ධ ව අවධානමක් ඇති විට යුද්ධ කිරීමට ඇති අයිතිය පිළිගැනෙන කරුණකි. ඇතැම් විට ශුද්ධ යුද්ධය ලෙස ආගමික දෘෂ්ටි කෝණයෙන් ද යුද්ධය සාධාරණීකරණය කරන අවස්ථා අපට හමු වේ. මිනිසුන් මරණයට පත් කිරීම නීත්‍යනුකූල ද? ආචාරාත්මක ද? ආගමානුකූල ද? යනාදී ගැටලු මෙහි දී මතු වේ. සාමවාදියා මේ පිළිබඳ ව විශ්ලේෂණාත්මක ව කරුණු දක්වයි. දේශප්‍රේමීයත්වය පිළිබඳ කථා කරන විට යුද්ධය හා යුද්ධයට සම්බන්ධ වීම උත්කර්ෂවත් අන්දමින් වර්ණනාවට ලක් කරන අවස්ථා හමු වේ. සමකාලීන දාර්ශනික බට්‍රන්ඩ් රසල් මේ ගැන සාකච්ඡා කරයි (Rafique, 2017).

''දේශප්‍රේමීහු සැම විට ම තම රට වෙනුවෙන් දිවිය කැප කිරීම පිළිබඳ කථා කරති. එහෙත් ඔවුන්ගේ රට වෙනුවෙන් ඝාතනය කිරීම පිළිබඳ ඔවුහු කථා නො කරති.'' යනුවෙනි.

අනිකා මැරීමෙන්, අනිකාට හිංසා කිරීමෙන් හෝ පීඩාවට පත් කිරීමෙන් තොර ව කිසඳු යුද්ධයක් සිදු කළ නො හැකි ය. එහෙත් කුමන පදනමක් මත හෝ එවැනි හිංසනයක් මානවයාට සිදු කළ හැකි ද? යන්න යුද්ධයෙහි ඇති ආචාරාත්මක ගැටලුව පිළිබඳ සාකච්ඡා කරන විට විමසා බැලේ. ශුද්ධ වූ යුද්ධයක් පිළිබඳ සාකච්ඡා කරන ආගමික ඉගැන්වීම්වල පවා අපට හමුවන වැදගත් ආචාරධර්ම මූලධර්මයක් ලෙස ස්වර්ණමය නීතිය (Golden Rule) හැඳින්විය හැකි ය. එය පෙරදිග ආගම්වල 'අත්තූපනායික ධර්ම පර්යාය' ලෙස හැඳින්වේ. මෙහි දී සිදු කරන දෙය වන්නේ තමා උපමා කොට අනිකා දෙස බැලීම යි. අනිකා ද තමන් හා සමාන බවත් තමන් මෙන් ම මරණයට හා හිංසා කරනු ලැබීම අප්‍රිය කරන බවත් කල්පනා කොට අනිකා දෙස බැලීමේ ක්‍රමය යි. මෙය ඉතා සංකීර්ණ ප්‍රජානාත්මක අවස්ථාවකි. මෙහි දී ද අපට චාරිත්‍ර හා වාරිත්‍ර අංශ දෙකක් හමු වේ. එක් පැත්තකින් අනුන් තමාට සිදු කරන එහෙත් තමා ප්‍රිය නොකරන දේවල් අනුනට සිදු කිරීමෙන් වැළකී සිටී. අනික් පැත්තෙන් අනුන් විසින් තමාට සිදු කරන එමෙන් ම තමා ප්‍රිය කරන දේවල් අනුන්ට ද කිරීමට වග බලා ගනියි. අනිකාගේ ස්වභාවය තේරුම් ගැනීමට නම් සහානුකම්පනය (Empathy) වැදගත් බව මනෝවිද්‍යා උපදේශනයෙහි සඳහන් කරන කරුණකි. එය අනුකම්පාව (Sympathy) නො වේ. අනිකාගේ සිතුම්, පැතුම්, හැඟීම්, වේදනාදිය තමන්ගේ දෘෂ්ටි කෝණයෙන් බලා අනිකා තේරුම් ගන්නා වැදගත් උපක්‍රමයකි. මෙහි දී සාමවාදියා ප්‍රකාශ කරන්නේ අනිකා විසින් තමා මරනු ලැබීම, හිංසා කරනු ලැබීම හෝ පීඩාවට පත් කරනු ලැබීම තමා නොඉවසන්නේ යම් සේ ද ඒ අනුව ම බලා එවැනි දේ අනිකාට සිදු කිරීමෙන් වැළකීම වැදගත් වන බව යි (Bowie, 2001).

බොහෝ අවස්ථාවල යුද්ධයට වාසි සහගත වූ තර්ක මිනිසුන් විසින් කියනු අසන්නට ලැබේ. රටක සිටින මිනිසුන් ආරක්ෂා කිරීමට නම් යුද්ධය අවශ්‍ය වන අවස්ථා ඇත. රටක ඇති ස්වාධීනත්වය ස්වෛරීභාවය හා ආරක්ෂාව සඳහා ද යුද්ධය අවශ්‍ය වේ. කිසියම් රටක ජීවත් වන මිනිසුන්ගේ නිදහස ආරක්ෂා කිරීමට ද යුද්ධය අවැසි බව ප්‍රකාශ වන අවස්ථා දක්නට ලැබේ. එමෙන් ම රටෙහි යුක්තිය හා සාමය සඳහා ද යුද්ධය අවැසි බව ප්‍රකාශ වන අවස්ථා අපට හමු වේ. එහෙත් මෙහි දී පැන නඟින ගැටලුව වන්නේ මෙම පදනම මත සිට යුද්ධය පිළිගත හැකි ද යන්න යි. සාමවාදියා ප්‍රශ්න කරන්නේ යුද්ධය කෙසේ සාමය ආරක්ෂා කරන්නේ ද? යන්න යි. එමෙන් ම එකෙකු මරා තවෙකෙකුගේ නිදහස ආරක්ෂා කරන්නේ කෙසේ ද? යන්න යි. යුද්ධයෙහි ඇති දුෂ්ටත්වය කෙසේ යුක්තිය ස්ථාපනය කරන්නේ ද? යන්න යි. සාමවාදියාට කුමන පදනමක සිටවත් යුද්ධය අගය කළ නොහැකි නිසා මෙවැනි ප්‍රශ්න විමසමින් යුද්ධයෙහි බිහිසුණු බව නැවත නැවතත් සපථ කර දක්වයි.

ඇඩොල්ෆ් හිට්ලර්ගේ නාසිවාදයෙන් ගම්‍ය වන යුද්ධය කෙසේවත් වර්ණනා කළ නො හැකි ය. යුද්ධයක දී සිදු වන මරණය හා හිංසනයට අමතර ව තව දුරටත් යුද්ධය විශ්ලේෂණය කර බැලීමට සාමවාදියා යොමු වේ. හිට්ලර් මෙන් අහිංසක සිවිල් ජනතාව ජාතිවාදී හෝ වෙනත් වෙනස්කමක් පදනම් කොට වෙඩි තබා මරා දැමීම සුදුසු ද? ගෑස් වධකාගාරවලට දමා මිනිසුන් හිංසනයට භාජනය කළ යුතු ද? ආහාර ජලය වැනි මූලික අවශ්‍යතා ලබා නො දී ක්‍රමයෙන් මිනිසුන් මරණයට පත් කිරීම සුදුසු ද? හිට්ලර් වැනි ඝාතකයෙකු මේ අනුව කෙසේවත් පිළිගත නොහැකි බව පැහැදිලි වන්නේ ය. යුද්ධයක දී සිදු වන මිනිස් ඝාතනය හෝ අවි ආයුධ ජාවාරම අගය කළ හැකි ද? තම ස්වාමි පුරුෂයන් අහිමි වී වැන්දඹුවන් ලෙස ජීවත් වීම, අසරණ වන දරුවන්ගේ මානසිකත්වය කෙසේ අගය කළ හැකි ද? යුද විජයග්‍රහණය

උදෙසා හිරෝෂිමා - නාගසාකි නගරවලට හෙළූ බෝම්බ සිදු කළ හානිය අපට අගය කළ හැකි ද? එපමණක් නො ව තවත් පුළුල් දෘෂ්ටි කෝණයකින් සලකා බැලූ විට යුද්ධය නිසා පරිසරයට, සතුන්ට හා ගස් කොළවලට සිදු වන හානිය පිළිබඳ කවුරු ප්‍රශ්න කරන්නේ ද? අතීතයේ දී පැවති යුද්ධවල දී කොතරම් අශ්වයන්, හස්තීන් හෝ ඔටුවන් වැනි සතුන් මිය ගොස් ඇත් ද? මෙසේ යුද්ධය මිනිසාට පමණක් නො ව සමස්ත ගෝලීය පරිසරයට ම හානි සිදු කරන බැව් පැහැදිලි ය. මෙවැනි පසුබිමක අනිකා පරාජය කිරීම වෙනුවෙන් සිදු කරනු ලබන යුද්ධය කෙසේවත් අගය කළ නො හැකි බව පැහැදිලි වන්නේ ය.

අනිකාගේ ජීවිතයට ගරු කිරීම අන්තර්ජාතිකව පිළිගත් මූල ධර්මයකි. මූලික අයිතිවාසිකම්වල ජීවත් වීමේ අයිතිය යනුවෙන් මෙය සඳහන් වේ. සාමවාදියා ඉනුත් ඔබ්බට ගොස් ජීවිතය යනු වටිනා, ගෞරවනීය, පූජනීය දෙයක් ලෙස හඳුනා ගනී. මානව ජීවිතයේ පූජනීයත්වය මානවයෙකු ලෙස උපත ලබන සෑම අයෙකුට ම හිමි වන දෙයකි. මානවයා අතර ඇති ඥාතීත්වය ඉවත දැමිය නො හැකි ය. ඒ නිසා ඔවුන් අතුරින් කොටසක් මිත්‍රයන් ලෙසත් තවත් පිරිසක් සතුරන් ලෙසත් සැලකීම වැරදි ය. සෑම මානවයෙකු ම 'මානවයා' නැමති ඡත්‍ර පදයට නැතහොත් පොදු කුලකයට අන්තර්ග්‍රහණය කරගත යුතු ය. ඒ වෙනුවට අනිකාගේ ඇති කිසියම් වෙනස්කමක් පදනම් කරගෙන සිදු කරනු ලබන වෙනස්කොට සැලකීම කෙසේවත් අනුමත කළ නො හැකි බව සාමවාදියා පෙන්වා දෙයි. වරක් ඇල්ජීරියාවේ උපන් ප්‍රංශ ලේඛක ඇල්බයා කැමූ මෙසේ ප්‍රකාශ කළේය (Bowie, 2001).

''අප මේ ජන වර්ගයට අයත් ය. මේ මේ රටට අයත් ය. මේ මේ පුද්ගලයාට, මේ මේ රටට ආදරය කරන්න නැතහොත් වෛර කරන්නයැයි අප ව පොලඹවනු ලැබ තිබේ. එසේ වුවත් අප අතුරින් කිහිප දෙනෙකුට හෝ එවැනි තෝරා ගැනීමක් සිදු කිරීමට මානවීය බවෙහි ඇති ගැටලුව දැනෙන බව පෙනේ.''

යුද්ධ හා හිංසන මානව විරෝධී, අමානුෂික ක්‍රියා බව ප්‍රකාශ කිරීමට සාමවාදියා පසුබට වන්නේ නැත. එමෙන් ම එය ප්‍රායෝගික ද නොමැත. අයුක්ති සහගත ය. සදාචාර විරෝධී වනවා පමණක් නො ව නාස්තිකාර ය. හිසංනයට ආදේශ කළ හැකි හොඳ ම විකල්පය අවිහිංසනය යි. මිත්‍රත්වය යි. සාමය යි. එහෙත් හිංසනයෙන් වැළකීම පමණක් සාමය නො වේ. එය සාමයට යන දුෂ්කර ගමනෙහි තවත් එක් වැදගත් අවස්ථාවක් පමණි. යථාර්ථවාදී සාමයක් ළඟා කර ගැනීමට නම් පැහැදිලි ක්‍රියාකාරී මැදිහත් වීමක් සිදු කළ යුතු ය. සමාජ ප්‍රගමනය කෙරෙහි ඍණාත්මක ව බලපාන ගැටුම් තව දුරටත් කිරීම උදෙසා උපාය මාර්ගික ක්‍රමවේද අනුගමනය කිරීමේ අවශ්‍යතාව ද මෙහි දී අවධාරණය කෙරේ. සාමවාදය යුද්ධය බැහැර කරනවා සේ ම සාමය උදෙසා සාමාජික වශයෙන් කළ යුතු දේ හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කරයි.

බොහෝ දැනුම් පද්ධති සඳහා මූලික වශයෙන් මූලාශ්‍රය වී ඇත්තේ ආගමික සංකල්පනාවන් ය. සාමය පිළිබඳ චින්තනය මානව සමාජයේ මුල් බැස ගැනීමට ද ආගමික චින්තනය සංකල්පීය වශයෙන් දායකත්වය ලබා දී තිබේ. මෙය ආකාර දෙකකින් හඳුනාගත හැකි ය. ඉතිහාසඥයන් සමහර විට ආගම දෙස නිශේධනාත්මක ව බලමින් යුද්ධය වර්ණනා කරන, ඒ සඳහා පොලඹවන ඉතිහාසයක් ඇතැයි තර්ක කරන අවස්ථා ඇත. එහි කිසියම් සත්‍යතාවක් ද ඇත. ආගමික සංකල්ප ප්‍රභවය වූ මුල් අවධියේ මිනිසා ගත කළ ගෝත්‍රික ජීවිතය සමඟ තම ගෝත්‍රයේ පැවැත්ම වෙනුවෙන් සටන් වැදීමට පවා ඒ ඒ ගෝත්‍රිකයන් යොමු වී තිබේ. අනෙකුත් ගෝත්‍රවලින් එල්ල වන තර්ජන හමුවේ මේ

නිසා යුද්ධයට, වීරත්වයට හෝ ගැටුමට අධිපති දෙවියෙකු පවා නිර්මාණය කොට තිබේ. සතුන් පමණක් නො ව මිනිසුන් පවා එම දෙවියන් වෙනුවෙන් යාගයට හසු කිරීම ගෝත්‍රික ආගම්හි දක්නට ලැබේ. එවිට අපට පෙනෙන්නේ ප්‍රචණ්ඩත්වය නෛසර්ගීය දෙයක් ලෙස ආගමෙහි මුල් යුගයෙහි සිට ක්‍රියාත්මක පැවති බව යි. එහෙත් ගෝත්‍රික අදහස්වලින් මිදුණු මිනිසා වඩාත් පුළුල් ව සිතමින් සාමූහික ව ජීවත් වීමේ අගය තේරුම් ගෙන ඇත. අනික් අතින් ආගමෙහි පවත්නා නෛසර්ගීය දෙයක් ලෙස 'සාමය' සැලකිය හැකි බව ඇතැම් ඉතිහාසඥයෝ පෙන්වා දෙති. ආගම දෙස කාර්යබද්ධවාදී ව බැලූ විට 'සාමය' එහි මූලික කාර්යකි (ඉලංගකෝන්, 2016). අඩුම තරමින් තම ගෝත්‍රික ජනතාව අතර සාමය, සමගිය සහයෝගය පවත්වාගෙන යාමට ආගමික සංකල්ප හේතු වී තිබේ. පැරණි ගෝත්‍රික සමාජයෙහි ආගමික නායකයා වූයේ ද ගෝත්‍රික නායකයා යි. තම ගෝත්‍රයෙහි සාමාන්‍යත්වය, ආචාර ධර්ම, පිළිගැනීම් පවත්වාගෙන යාමට ගෝත්‍රික නායකයා දෙවියා, යක්ෂයා හෝ වෙනත් අද්භූත බලවේගයක පිහිට ලබා ගෙන ඇත. තම ගෝත්‍රයෙහි සියලු දෙනා එක් ආගමික සංකල්පයකට ඒකරාශී කිරීමට එමගින් හැකියාව ලැබී තිබේ. එහෙත් ගැටලුව වූයේ එම ආකල්පයෙන් ම 'අනිකා' දෙස එනම්, අනිකුත් ගෝත්‍රික සමාජ දෙස බැලීමට තිබූ අවහිරය යි. අනිකා දෙස තමාගේ විරුද්ධවාදියෙකු, සතුරෙකු ලෙස බැලීම නිසා ගෝත්‍රික ගැටුම් උත්සන්න විය. ඒ නිසා මානව ඉතිහාසය ගත් විට ගැටුම් පිළිබඳ ඉතිහාසයක් වන බව පැහැදිලි ය. එහෙත් ඉතාමත් හිංසාකාරී හා භයානක ප්‍රතිඵල ලබාදුන් යුද්ධය පිළිබඳ සාකච්ඡා කරන විට ආගමිකත්වයට වඩා ජාතිකත්වය හෝ දේශපාලනික චේෂ්ටා මූලික වී ඇති බව පැහැදිලි වේ.

ලෝක ආගම් බිහි වීමට කලින් ප්‍රාදේශීය වශයෙන් ප්‍රභවය ලැබූ ආගම් කිසියම් පටු සීමාවක ක්‍රියාත්මක වුවත් එහි දී ආධ්‍යාත්මිකත්වය හා සදාචාරය ඉහළ මට්ටමකින් ක්‍රියාත්මක ව තිබේ. මෙහි දී ආධ්‍යාත්මිකත්වයෙන් පුද්ගලයාගේ සංහිඳියාව හා එකඟකම අවධාරණය කළ අතර සදාචාරාත්මක සමාජ එකඟත්වය, සහයෝගය අපේක්ෂා කළ බව පැහැදිලි වේ. මෙහි මූලික හරය වන්නේ පුද්ගලයා විසින් අනුගමනය කළ යුතු යැයි අපේක්ෂා කළ පිළිගැනීම් හෝ සංකල්ප භාවිතයට ගනිමින් සමාජයක කෙසේ ඒවා ක්‍රියාත්මක කළ හැකි ද? යන කරුණ යි. මේ නිසා සාමාජයේ සාමය ගොඩනැගීම වූ කලී පුද්ගලයා අනිකා සමග දක්වන සබඳතාව හෝ යහ පැවැත්ම සමග ඍජු ව ම සම්බන්ධ වන බව පෙන්වා දී ඇත. ආගම විසින් ලබා දුන් දැක්ම තම පැවැත්ම ස්වාධීන නොවන බව තේරුම් ගෙන අනිකා සමග බැඳී ඇති බවත් තේරුම් ගැනීම ඉහළ ආකල්පමය අවස්ථාවකි. අන්තර් පරායත්ත බව මිනිසා හා මිනිසා අතර පමණක් නො ව මිනිසා හා පරිසරය අතර ද පවත්නා බව පෙන්වා දී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස කෘතඥතාව, ගෞරවය, සැලකීම, සහයෝගී බව වැනි ආචාරාත්මක ආකල්ප ප්‍රාථමික මිනිසා තුළ ජනිත වේ. සොබාදහම වන්දනා කිරීම එහි එක් වැදගත් පැතිකඩක් විය. මෙසේ ප්‍රාදේශීය වශයෙන් බිහි වූ ආගමික සංකල්පනාවල ඉතා පළල් ආචාරාත්මක සංකල්පනා ගැබ් ව පැවති බව පැහැදිලි වේ (සිවරාක්ෂා, 2010).

යුදෙව් ආගම බිහි වූ පසුබිම ගැන සලකා බලන විට පැහැදිලි වන වැදගත් කරුණක් වන්නේ දේවත්වය පදනම් කරගෙන යුදෙව් ජාතිකත්වය තුළ සමගිය ඇති කිරීමට දැක්වූ සුවිශේෂී හැකියාව යි. ඒ සඳහා යුදෙව් ආගමේ නිර්මාතෘ මෝසස්ගේ පැවැති නායකත්වය ද බෙහෙවින් හේතු වූ බව පැහැදිලි ය. හිබෲ නීති ග්‍රන්ථය සේ සැලකෙන 'තෝරා' සඳහන් කරන්නේ

සාමය කෙනෙකුගේ අවසාන ඉලක්කය විය යුතු බව හා දිව්‍යමය ත්‍යාගයක් බව ය. 'ෂලෝම්' ලෙස එකිනෙකාට සුබපතා ගන්නා වචනයෙහි අරුත වන්නේ ද 'සාමය' යන්න යි. තව ද මෝසස් විසින් හඳුන්වා දුන් දස වැදැරුම් නෛතික පද්ධතියේ මිනිසා හා මිනිසා අතරත් මිනිසා හා දෙවියන් අතරත් අන්‍යෝන්‍ය සම්බන්ධතාව ගොඩනඟා ගැනීම මගින් සමාජීය සාමය මෙන් ම විශ්වීය සාමයක අවශ්‍යතාව පෙන්වා දී තිබේ. තවත් යුදෙව් මූලාශ්‍රයක් වන 'නෙවීම්' ග්‍රන්ථයේ සඳහන් වන පරිදි ආනාගතයෙහි ඇති වන සර්ව සුබවාදී ලොවක් ගැන ප්‍රාර්ථනයක් ඇත. ඒ අනුව පීඩාවක් නොමැති, යුද්ධයක් නොමැති, යුද්ධ කිරීමක් නොමැති පරමාදර්ශී තත්වයක් පිළිබඳ අපේක්ෂාවක් ගැන යුදෙව් ආගමෙහි සඳහන් වේ. 'කෙටුවීම්' නමැති යුදෙව් මූලාශ්‍රය පුද්ගල අභ්‍යන්තරික සාමයක් ගැන කථා කරන අතර එය අත්දැකීමෙන් හා අවබෝධයෙන් ළඟා කර ගන්නා දෙයක් බව සඳහන් කොට ඇත. එවැනි ආධ්‍යාත්මික දියුණුවක් ලත් අයෙකුට 'සාමය' යනු පෞද්ගලික අත්දැකීමකි. එසේ වුව ද සතුරා පරාජය කොට යුද්ධය ජයග්‍රහණය කිරීම වර්ණනා කරන අවස්ථා පරණ තෙස්තමේන්තුවෙහි නැතහොත් හීබෲ බයිබලයෙහි සඳහන් වේ. ''ඇසට ඇසක්, දතට දතක්'' වැනි කියමන් මෙහිදී කෙසේවත් අමතක කළ නො හැකි ය (Rafique, 2017).

ලොව පැරණිතම ආගමක් ලෙස සැලකෙන හින්දු ආගමෙහි සාමය පිළිබඳ අදහස එහි මූලික ආචාරාත්මක සංකල්පයක් වන අවිහිංසාව මත පදනම් ව පවතී. භාරතීය ආගමක් වන හින්දු ආගමික චින්තනය ජෛන හා බෞද්ධ ආගම් සමඟ ද යම් ඌන පූරක බවක් දක්වන බව භාරතීය ආගමික ඉතිහාසය දෙස බලන විට පැහැදිලි වේ. එහෙත් හින්දු ආගමේ සාමය පිළිබඳ සංකල්පය එක් එක් කාල වකවානුවට හා එක් එක් ආගමික ගුරු කුලවලට සාපේක්ෂ ව තේරුම්ගත යුතු ය. උදාහරණ ලෙස බ්‍රාහ්මණ යුගයේ දී යාගයට ප්‍රමුඛත්වය හිමි වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අවිහිංසාවාදය යටපත් ව තිබිණි. එහෙත් වඩාත් ආධ්‍යාත්මිකත්වයට යොමු ව තිබූ උපනිෂද් යුගයේ දී අවිහිංසාවාදය පදනම් වූ ආචාරධර්මීය ඉගැන්වීම් ඉහළින් ම අගය කෙරිණි. ශ්‍රී ක්‍රිෂ්ණ වන්දනයට යොමු වූ බැතිමතුන් සිය යුතුකම වෙනුවෙන් යුධ වැදීම පවා ආචාරාත්මක ඉගැන්වීමක් ලෙස සලකා කටයුතු කරන බව පෙනේ. කෙසේ වුව ද පොදුවේ ගත් විට හින්දු චින්තනයේ සාමවාදී බව වැඩිපුරම කැපී පෙනෙන බැව් පෙන්වා දිය හැකි ය. ඒ සඳහා එහි ඉගැන්වෙන කර්ම සංකල්පය වැදගත් මෙහෙයක් ඉටු කරයි. ප්‍රාණඝාතය හා හිංසනය බලවත් ප්‍රතිවිපාක ලබාදෙන කර්ම බැවින් ඒවායින් වැළකීමෙහි වැදගත්කම එහි දී පෙන්වා දී තිබේ. ඒ නිසා බැතිමත් හින්දූන් සිය ජීවන මාර්ගය ධර්ම සංකල්පයට අනුකූල ව පවත්වාගෙන යන බව පෙන්වා දිය හැකි ය. එමෙන් ම පවුල හා පවුලේ සාමාජිකයන් අතර පැවැතිය යුතු අන්‍යෝන්‍ය සබඳතා ගැන ඉගැන්වෙන හින්දු ආචාරාත්මක ඉගැන්වීම් ද මෙහි ලා පවුලෙහි සමඟිය පවත්වා ගැනීම සඳහා ඉවහල් වන බව පැහැදිලි ය. එය ගෝලීය සංකල්පයක් දක්වා ව්‍යාප්ත කරන හින්දු දහම ''වසුධෛව කුටුම්බකං'' යනුවෙන් සමස්ත මානව සමාජය ම පවුලකට සමාන කරයි. හින්දු දහමේ දැකිය හැකි බහුවිධතාව ප්‍රකට කරන්නේ ආගමේ ඇති සංහිඳියාව යි. පොදුවේ ගත් විට බොහෝ හින්දූන් නිර්මාංශික ආහාර රටාවක් අනුගමනය කරන්නේ ද අවිහිංසවාදය කරණ කොටගෙන යි. මහත්මා ගාන්ධිතුමාගේ ව්‍යාපාරය නිසා ද බොහෝ හින්දූන් අවිහිංසාව ප්‍රධාන ආචාර ධර්මීය සංකල්පයක් ලෙස සිය ජීවිතයට සම්බන්ධ කරගෙන සිටින බව පෙන්වා දිය හැකි ය (Rajapaksa, 1991). එසේ වුවත් හින්දු සමාජ දර්ශනයේ ඉගැන්වෙන කුල වාදය,

කාන්තාව පහත් කොට සැලකීම හා ස්වධර්ම වැනි ඉගැන්වීම් ද ඇතැම් ගුරුකුල අනුගමනය කරන සත්ව යාගය නිසා ද හින්දු දර්ශනයෙහි එන සාමය පිළිබඳ සංකල්පයට අඩු ඇගයීමක් ලැබෙන බව පෙන්වා දිය යුතු ය.

බුදු දහමේ නිර්මාතෘ වන සිද්ධාර්ථ ගෞතම බුදුන් වහන්සේ හඳුන්වන අපර නාමයක් වනුයේ 'ශාන්ති රාජ' යන්න යි. මෙහි 'ශාන්ති' යනු 'සාමය' යන අරුත ද 'රාජ' යන්න 'පාලකයා' යන අරුත ද ලබා දෙයි. මේ අනුව සාමය බුදු දහමෙහි මූලික ම අපේක්ෂාවක් බව ඉගැන් වේ. ප්‍රාණඝාතය බෞද්ධ පංචශීල ප්‍රතිපදාවෙහි ප්‍රධානතම අංගය යි. එහි මිනිසා ඇතුලු සියලු සතුන්ගේ ප්‍රාණය නැති කිරීම බලවත් අකුසල කර්මයක් ලෙස ඉගැන්වෙන අතර එහි ප්‍රතිඵල ද භයානක වන්නේ ය. 'මෛත්‍රීය' සංකල්පයට අනුව අනිකාට මිත්‍ර ස්වභාවයෙන් සැලකිය යුතු අතර කිසිඳු ආකාරයක හිංසනයක් සිදු කිරීම අනුමත නො කරයි. යුද්ධය වැනි ගැටුම්වලට පුද්ගලයාගේ ක්‍රියාත්මක වන මානසික දුර්වලතා හේතුවන බව පෙන්වා දෙන බුදු දහම එය 'තෘෂ්ණාව' ලෙස හඳුන්වයි. වස්තූන්ට ආශා කිරීම මෙහි ස්වභාව යි. එහි එක් පරිණාමයක් වන 'විභව තණ්හාව' අනුන්ට හිංසා කිරීමට මෙන් ම තමාට හිංසා කිරීමට ද පුද්ගලයා පොලඹවන අභ්‍යන්තරික ප්‍රේරණයකි (Tilakaratne, 2020). ඒ නිසා බලය, ධනය, කීර්තිය, තනතුරු වැනි දේ අත්පත් කර ගැනීමට ඇති පුද්ගල කෙලෙස් තත්වයන් සමාජ ගැටුම් ඇති වීමට හේතුවන බව පෙන්වා දෙන බුදු දහම පුද්ගලයාගේ අභ්‍යන්තරික ශික්ෂණයකින් බොහෝ සමාජ ගැටුම් සමනය කරගත හැකි ආකාරය පෙන්වා දී තිබේ.

යුදෙව් ආගමෙහි පැවති හිංසාත්මක ඇතැම් ඉගැන්වීම් බැහැර කරමින් ප්‍රතිසංස්කරණවාදී ඉගැන්වීමක් ඉදිරිපත් කළ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සිය චරිතයෙන් ම අවිහිංසාවෙහි ඇති වැදගත්කම පෙන්වා දී ඇත. ඒ නිසා ක්‍රිස්තියානි ආගමෙහි සාමය පිළිබඳ ඉගැන්වීම් ආදර්ශමත් ක්‍රිස්තු චරිතය ඔස්සේ ප්‍රකාශයට පත් වේ. සිය සගයෙකු තමා පාවා දුන් අවස්ථාවේ පවා ඔහු කෙරෙහි වෛරයක් ප්‍රකට නොකළ උන් වහන්සේ තමා කුරුසයෙහි ඇණ ගැසීම දක්වා කරන ලද සියලු පීඩාවන් ඉවසා දරා සිටියහ. දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් ලෙස කටයුතු කළ යේසුස් වහන්සේ සිය චරිතයේ දී අනිකා කෙරෙහි දක්වන කරුණාව අවස්ථා ගණනාවක දී ප්‍රකට කර ඇත. විශේෂයෙන් ම කාන්තාව හා ළමයා කෙරෙහි දැක් වූ කරුණාව සමාජ සාමය පවත්වා ගෙන යාමේ දී වැදගත් ආචාරාත්මක සංකල්ප ලෙස සලකා තිබේ. කෙසේ වුව ද පරිපූර්ණ සාමය ලැබෙන්නේ දෙවියන්ගේ පරමත්වය සමඟ ඒකාත්මික වීමෙනි. (Rafique, 2017) එය මරණින් පසු ලැබෙන පූර්ණත්වයකි. පරිසරය කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කරන කිතු දහම එහි ඇති දිව්‍යමය බව නිසා එය සංරක්ෂණය කළ යුතු බැව් පෙන්වා දී ඇත. විවිධ මිථ්‍යා ඇදහිලිවලින් බෙදී වෙන් වී සිටි ජනතාව ඒකදේවවාදී ඉගැන්වීම් මඟින් සාමකාමී සමාජයක් නිර්මාණය කිරීමට ක්‍රිස්තියානි ඉගැන්වීම් පාදක වී තිබේ.

සාමයේ ආගම ලෙස හඳුන්වනු ලබන ඉස්ලාම් දහමේ හැඳින්වෙන නාමයෙහි අරුත ද 'සාමය' යන්න යි. ඒකදේවවාදීව ලොව අර්ථ ගන්වන නිසා දෙවියන්ට අවනත වීම මඟින් පුද්ගලයා ලබන සංහිඳියාව මෙසේ සාමය ලෙස අර්ථ ගන්වා තිබේ. කෙසේ වුව ද ඉස්ලාම් දහමේ ජිහාඩ් ලෙස ඉගැන්වෙන ශුද්ධ වූ යුද්ධය පිළිබඳ සංක්ලපය ඉස්ලාමීය ත්‍රස්තවාදයෙහි ක්‍රියාකාරීත්වයට බලපා තිබෙන බැවින් ඉස්ලාම් මූලික ඉගැන්වීම් තර්ජනයට ලක් ව තිබේ. එහෙත් ජිහාඩ් යනු ආධ්‍යාත්මික ව තේරුම් ගත යුතු සංකල්පයක් බව ඉස්ලාම් විද්වත්තු පෙන්වා දෙති. පුද්ගලයා

තුළ ක්‍රියාත්මක වන පාපකාරී සිතිවිලිවලට එරෙහි ව පුද්ගලයා විසින් සිදු කරන සටන ශුද්ධ වූ යුද්ධය වන අතර එය ජය ගතහොත් සමාජ සාමය උදෙසා එය යොදා ගත හැකි බව පෙන්වා දී තිබේ. මේ නිසා එ මඟින් අනිකාට හිංසා කිරීම හෝ අනිකා මරණයට පත් කිරීමට අදාළ කිසිවක් ගම්‍යමාන නො වේ (Rafique, 2017). ඉස්ලාම් සමාජ ආචාරධර්මවල හමුවන සකාත් (දන්දීම) වැනි ඉගැන්වීම් සමාජ සාධාරණත්වය කෙරෙහිත් අනිකාට ගරු කිරීම, සැලකීම වැනි ගුණාංග ප්‍රකට කරන ඉගැන්වීමකි. එක්දේවවාදී සංකල්පයේ දී සියලු දෙනා එකමුතු කිරීම ඉස්ලාම් දහමෙහි අරමුණ යි.

**ගාන්ධි ආදර්ශය**

මහත්මා ගාන්ධි වරක් ප්‍රකාශ කර සිටියේ තම අහිංසාවාදී චින්තනය කෙරෙහි හින්දු සහ බෞද්ධ මූලාශ්‍රය පදනම් වූවා සේ ම රුසියානු මහා ගත්කරු ලියෝ ටෝල්ස්ටෝයි ගේ ‘The Kingdom of God is within You’ නැමැති කෘතිය ද එකසේ බලපෑමක් කළ බව යි. නිර්මාංශ ප්‍රතිපත්තිය පවා අනුගමනය කළ ටෝල්ස්ටෝයි යුද්ධය ප්‍රතික්ෂේප කළ සාමය උත්කර්ෂයට නැංවූ ලේඛකයෙකු බව ප්‍රසිද්ධ ය. ඒ සඳහා ඔහුට ක්‍රිස්තියානි චින්තනයත් විශේෂයෙන් ම යේසුස් චරිතයත් ආදර්ශ සපයා ඇත. ගාන්ධිගේ අවිහිංසාවාදී ව්‍යාපාරය ප්‍රධාන මූලධර්ම හයක් මත පදනම් විය.

i. සත්‍යවාදී බව
ii. අහිංසාවාදී බව
iii. නිර්මාංශවාදය
iv. බ්‍රහ්මචර්යාව
v. සරල බව
vi. භක්තිය (සෙනෙවිරත්න, 2008).

ඔහුට අනුව ‘‘භක්තිය (Faith) වනාහි මාගේ ආගම වන අතර අවිහිංසාවාදී සෘජු ක්‍රියා එහි ප්‍රකාශනය”යි. ලෝකය වෙනස් කිරීමට කෙනෙකු ඉදිරිපත් වෙන්නේ නම් පළමු ව තමන් වෙනස් වී සිටිය යුතු බව ද හෙතෙම අවධාරණය කර සිටියේ ය. අවිහිංසාවාදී සෘජු ක්‍රියාමාර්ගයක දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග කිහිපයක් ද ඔහු පෙන්වා දී තිබේ.

i. මනුෂ්‍යයන් හැටියට විරුද්ධවාදියාට ගරු කරන්න.
ii. ගැටුමකට මැදිහත් වී සිටින සැමදෙනා කෙරෙහි සැලකිල්ලක් දක්වන්න.
iii. හිංසනය/අලාභ හානි කිරීමෙන් වළකිනවා මෙන් ම කිසිඳු කෙනෙකුට නින්දා අපහාස කිරීමෙන් ද වළකින්න.

**අශෝක ආදර්ශය**

මහත්මා ගාන්ධිගේත් මාටින් ලූතර් කිංගේත් අවිහිංසාවාදී ප්‍රතිපත්තිය අශෝක අධිරාජ්‍යයාගේ ප්‍රතිපත්තිය හා කිට්ටු සම්බන්ධතාවක් පවතින බව පෙනී යයි. ක්‍රි.පූ. 273-232 සමයෙහි ඉන්දියාව පාලනය කළ මෞර්ය අධිරාජ්‍යයෙකු වන මොහුගේ නමේ සංකේත අරුත වනාහි “ශෝකය නොදැනෙන පුද්ගලයා” යන්න යි. කාලිංග යුද්ධයේ දී තමන් අතින් සිදු වූ අති විශාල මිනිස් සංහාරය පිළිබඳ කනස්සල්ලට පත් ව අනතුරු ව අශෝක බෞද්ධ අවිහිංසාවාදී මූලධර්ම මත අධිරාජ්‍යය ආදර්ශමත් පාලනයකට යටත් කළේය. ඔහු දිග් විජය වෙනුවට ධර්ම විජය ආදේශ කළේ ය. යුද්ධය වෙනුවට සාමය ව්‍යාප්ත කළේ ය. ඔහු ස්ථාපනය කළ ධර්ම ලිපි ආශ්‍රයෙන් පැහැදිලි වන්නේ බෞද්ධ සංකල්ප ප්‍රමුඛ වශයෙනුත් අනිකුත් භාරතීය ආගමික අදහස් ද්විතීයික වශයෙනුත් අශෝක සාම චින්තනයට බලපා තිබෙන බව යි. අශෝක හඳුන්වා දුන් සාම මූලධර්ම කිහිපයක් මෙසේ ය.

i. සියලු ම සත්වයන් කෙරෙහි අවිහිංසාවාදී වන්න.

ii. පරුෂ සහ අශෝභන/ නොහික්මුණු කතාවලින් වළකින්න.

iii. දෙමාපිය, ගුරුවරු සහ පූජකවරුන්ට ගරු කරන්න.

iv. බ්‍රාහ්මණයන්ට, පූජකවරුන්ට සහ සේවකයන්ට සැලකිලි දක්වන්න.

v. යහපත් දිවිමඟකට යොමුවන්න. කරුණාව, ත්‍යාගශීලී බව, සත්‍යවාදී බව, පවිත්‍ර බව, මෘදු බව සහ කළගුණ සැලකීම යන ගුණාංගවලින් පෝෂිත කරවන්න (Pannasiha Thera, 1982)

**වියට්නාම් ආදර්ශය**

ති නා හන් (Thin Nhat Hanh) වියට්නාම් බෞද්ධ භික්ෂූන් වහන්සේ නමකි. බටහිර ලෝකයට බුදු දහම ව්‍යාප්ත කිරීමෙහි ලා පුරෝගාමී සේවාවක් සිදු කළ උන් වහන්සේ විසින් විශේෂයෙන් ම බෞද්ධ සංකල්පයක් වූ සම්මා සති (සිහි කල්පනාව-Mindfulnes) ප්‍රායෝගික ව අත්විඳීමට බටහිර සමාජය පොලඹවන ලදි. සාම චින්තකයෙකු වූ උන් වහන්සේ වියට්නාම් යුද්ධයට එරෙහි ව මාටින් ලූතර් කිං වැන්නවුන් පොලඹවාගනු ලැබීය. බුදු දහම සමාජ විපරිවර්තන ක්‍රියාවලිය සඳහා භාවිතයට ගත් හෙතෙම "මැදිහත්වීමේ බුදු දහම" (Engaged Buddhism) නම් වූ ව්‍යාපාරයේ නායකයා ද විය. උන් වහන්සේ වියට්නාම යුද්ධය අවසන් කිරීම උදෙසා 1969 දී පැරීසියේ පැවති සාම සාකච්ඡාවල දී නායකත්වය දැරී ය. එමෙන් ම උන් වහන්සේ 1967 දී නොබෙල් සාම ත්‍යාග යට නම් කෙරිණි. තව ද ප්‍රංශ, ඉංග්‍රීසි, චීන, සංස්කෘත, පාලි සහ ජපන් භාෂාවන් පිළිබඳ හසල දැනුමක් තිබූ උන් වහන්සේ විසින් රචිත පොත් සංඛ්‍යාව සියයකට වැඩි ය (Nhat Tu, 2014).

**සමාලෝචනය**

ආගම්වල ඉගැන්වෙන සංකල්ප විශේෂයෙන් ම ආචාරාත්මක සංකල්ප බොහෝ දුරට සාමය පිළිබඳ දර්ශනය ඔප් නැංවීම සඳහා ආභාසය සපයා ඇති බව මේ අනුව පැහැදිලි වන්නේ ය. ජනප්‍රිය කතිකාවතේ දී කිසියම් ආගමක දක්නට ලැබෙන නිශේධනාත්මක සංකල්ප මතු කොට දක්වා ආගම ප්‍රචණ්ඩත්වය අගය කරන යුද්ධයට ප්‍රේරණයක් සපයන පද්ධතියක් ලෙස හුවා දක්වන බව පෙනේ. එහෙත් සත්‍ය වශයෙන් ම ආගම් බිහි වී ඇත්තේ එක්කෝ කුඩා සමාජයක නැතහොත් සමස්ත මානව වර්ගයා අතර ඒකාබද්ධතාව ඇති කිරීමේ අරමුණෙන් බව පෙනී යයි. එබැවින් ඒ ඒ ආගම් සම්බන්ධයෙන් සිටින විද්වතුන් හා නායකයන් මෙම නිශේධනාත්මක ඉගැන්වීම් සඳහා නව අර්ථකථන ලබා දෙමින් ඒවායේ ඓතිහාසික වැරදි නිවැරදි කිරීමටත් බහුල ව ඇති සාමයට රුකුල් දෙන අදහස් ප්‍රචලිත කිරීමටත් ව්‍යාවෘත වීම කාලීන අවශ්‍යතාවක් වශයෙන් පෙන්වා දිය හැකි ය. තව ද ශාස්ත්‍රීය වශයෙන් මෙන් ම ආධ්‍යාපනික වශයෙන් ද ශීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින සාම චින්තනයෙහි පදනම ශක්තිමත් කිරීමට තව තවත් ආගමික සංකල්ප යොදා ගැනීමේ අවශ්‍යතාව ද මතු ව තිබේ. සාමය ඇති කිරීම උදෙසා ආගමික අදහස් එක් පැත්තකින් අලුත් න්‍යාය හා සංකල්ප උත්පාදනයට උපකාර කරන අතර අනික් අතින් ආගම එහි දැනුම් පද්ධතියේ සීමාවේ සිටිමින් සාමය යථාර්ථයක් කර ගැනීමට සිය දායකත්වය ලබා දෙමින් සිටී.

**මූලාශ්‍රය**


ඉලංගකෝන්, එස්. (2016) *සමය අධ්‍යයනඃ න්‍යායාත්මක ප්‍රවේශය*. කර්තෘ ප්‍රකාශන.

උයන්ගොඩ, ජේ. (2010) *සමාජීය - මානවීය විද්‍යා පර්යේෂණ*. කොළඹ 07ඃ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

තිලකරත්න, ඒ. (2008) *මිනිස් ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය*. (Human Problems in a

Buddhist Perspective) රාජගිරිය: කුරුළු පොත්.

විජේබණ්ඩාර, සී. සහ මොරටුවගම, එච්. එම්. (1985) *ආදි බෞද්ධ චින්තනය*. කොළඹ: එස්. ගොඩගේ.

සෙනෙවිරත්න, ජේ. (2008) *විසිවන සියවසේ අවිහිංසාවාදී සමාජ විප්ලවය හා සාමය*. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

සිවරක්ෂා, එස්. (2010). *ආගම හා සංවර්ධනය*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Bowie, R.B. (2001) *Ethical Studies*, Nelson Thornes: UK.

Galtung, J. (1985) *Peace and Buddhism*. Paris: University Nouvelle.

Jayatilleke, K. N. (1991) *The Buddhist Attitude to Other Religions*. Kandy: Buddhist Publication Society.

Karunadasa, Y. (2015) *Early Buddhist Teachings*. Kandy:Buddhist Publication Society.

Nhat Tu, T. (2011) *Engaged Buddhism, Social Change and World Peace*. Nhuan: Vietnam Buddhist University Publications, Phu

Pannasiha Thera, M. (1982) *Peace-through Tolerance and Co-existence*, Colombo: Ministry of Cultural Affairs,

Rafique, M. (2017) 'Concept of Peace in World's Major Religions: An Analysis.' I*nternational Journal of Scientific and Research Publications, Volume 7, Issue 4*. (www.ijsrp.org).

Rajapaksa, V. (1991) 'Some Consideration on the Ahimsa Doctrine.' *Sri Lanka Journal of Buddhist Studies Vol. III*: Buddhist and Pali University of Sri Lanka.

Tilakaratne, A. (2020). *Inter-religious Understanding, Collected Papers of Asanga Tilakaratne, Vol. V*, Nugegoda: Sarasavi Publishers:

Uyangoda, J. (2015). *Social Research.* Colombo 07: Social Scientists' Association,